නිවන් අවබෝධය පිණිස ධර්ම දේශනා මාලාව - 75

# දක්ෂයා

## බහුධාතුක සූත්‍රය

ආචාර්ය පූජනීය
**මිරිස්සේ ධම්මික ස්වාමින් වහන්සේ**

( ධර්ම දානය පිණිසයි. )

ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසින් ගුවන් විදුලිය ඔස්සේ ප්‍රචාරය කරන ලද ධර්ම දේශනාවන් ඇසුරෙන් සකස් කරන ලද ධර්ම ග්‍රන්ථයකි.

"ප්‍රඥා ප්‍රභා"
සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන
පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.
web : www.buddhismforyou.org

මුද්‍රණය
**පියසිරි මුද්‍රණාලය සහ සමාගම**
අංක 469, අතුරුගිරිය පාර, මාලබේ.
**ටෙලි : 011-2561551**

## පුණ්‍යානුමෝදනාව

තුන් ලොවක් නිවා සැනසූ මගේ භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය අප සැමට සරල බසින් දේශනා කරමින්, දහම් ඇස විවර කරන බත්තරමුල්ලේ සිරි සුදස්සනාරාම දහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක **අති පූජ්‍ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ** ඇතුළු ආරාම වාසී සියලුම ස්වාමීන් වහන්සේලොටද, ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

අහංගම, කතළුවේ, පදිංචිව සිටි **සොමී මාලිනී වික්‍රමසූරිය** නැන්දා පරලොව සැපත් වී වසරක් පිරීම සිහිකිරීම් වශයෙන් සහ ඉපදෙමින් මැරෙමින් යන මේ සංසාර ගමනින් අතිවිදීමටත් මෙම ධර්ම දානමය කුසලය උපකාර වේවා! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

එමෙන්ම අප දෙපාර්ශවයේම පරලොව සැපත්, දෙමව්පියන් වන **පවුලිස්. ඩබ්ලිව්. වීරසූරිය, ආර්. ජී. ජේන්ද සිල්වා, ඩබ්ලිව්. ඒ. පී. වීරරත්න, මැස්ලින් වික්‍රමසූරිය** මාගේ වැඩිමහල් සොයුරු උපාලි වීරරත්න යන මහත්ම මහත්මීන්ගේ සහ අප නමින් මියගිය සියලුම ඥාතී මිත්‍රාදීන්ටත් මේ පින් අනුමෝදන් වී උතුම් නිර්වාන ශාන්තිය අත්වේවා! යි ප්‍රාර්ථනා කරමු.

තවද, සුජීවත්ව සිටින දරු මුණුපුරු, මිණිපිරියන් ඇතුළු සියලු ඥාතිමිත්‍රාදීන්ටත් "ප්‍රඥා ප්‍රභා" සංවිධානයේ සැමටත්, මුද්‍රණ කටයුතු කරදුන් කාර්ය මණ්ඩලයේ සැමටත් මේ උතුම් ධර්ම දානමය කුසලය බැති සිතින් අනුමෝදන් කරමු. සියලු දෙනාටම ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් නිර්වාන ශාන්තිය ලැබේවා !

සුමිත්‍රා වීරරත්න (වීරසූරිය) සහ පවුලේ සැම
තලවතුගොඩ.
2016-08-17

# බහුධාතුක සූත්‍රය

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

**යානි කානි චී භික්ඛවේ, භයානි උප්පජ්ජන්ති, සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො ති.**

මහණෙනි, යම්කිසි භය කෙනෙක් උපදනාහු ද ඒ හැම බාලයා නිසා උපදිති., පණ්ඩිතයා නිසා නූපදිත්.

කාරුණික පින්වතුනි,

උතුම් බුදු රුවන, සදහම් රුවන, ආර්ය මහ සඟ රුවන, තුණුරුවන් සතු අනන්ත අසිරිමත් වූ ගුණ බෙලෙන් පින්වතුන් සියලු දෙනාටම ජීවිත ගමනේ හැම සැනසිල්ලක්, යහපතක්, අභිවෘද්ධියක්, ශාන්තියක් සැලසේවා. ඒ උතුම් වූ චතුරාර්‍ය සත්‍ය ධර්ම අවබෝධය පිණිස මෙම ධර්ම දේශනාවත් උපනිඃශ්‍රය වේවා! හේතු වේවා! යි මහත් වූ කරුණාවෙන් අධිෂ්ඨාන කරනවා! ප්‍රාර්ථනා කරනවා!

අද දේශනාව සඳහා ආශ්‍රය කරගනු ලබන්නේ **මජ්ඣිම නිකායේ උපරිපන්නාසකයේ අනුපද වග්ගයට අයත් බහුධාතුක සූත්‍ර දේශනාවයි.** දහම් කරුණු රාශියක් මේ සූත්‍ර දේශනාවේ ඇතුළත්ව තිබෙනවා. අපගේ විදර්ශනා මාර්ගයට උපකාර වන ධර්ම කරුණු රාශියක් මේ සූත්‍ර දේශනාවෙන් අපට තේරුම් ගන්නට පුළුවනි. ඔබගේ දහම් දැනුමත්, අවබෝධයත් මුල් කරගෙන ම මේ දහම් කරුණු පිළිබඳව ශ්‍රවණය කරන්න.



මේ සූත්‍ර දේශනාවෙන් ඔබට පැහැදිළි වනවා ඇති **බහුධාතුක** යන අදහස හිතට එනවිට, ධාතු යනුවෙන් සඳහන් වන්නේ යම් දෙයකට හේතුවන දෙය එනම් මූලය, බීජය, නිර්මාණය. **බහුධාතුක** යනු බොහෝ කොටස්, යම් යම් ධර්මයන්ට සංසිද්ධීන්ට හේතුවන මූලයන්. එයයි මේ සූත්‍ර දේශනාවෙන් පෙන්වා දෙනු ලබන්නේ.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටාණන්ගේ ආරාමයේ වැඩ වාසය කරනවා. එහිදී භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි', යයි භික්ෂූන් ආමන්ත්‍රණය කළා. 'වහන්ස, යයි ඒ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මේ බහුධාතුක සූත්‍ර දේශනාව භික්ෂූන්ට දේශනා කළා.

මහණෙනි, යම්කිසි භය කෙනෙක් උපදනාහු ද, ඒ හැම බාලයා නිසා උපදිති. පණ්ඩිතයා නිසා නූපදිත්. යම්කිසි උපද්‍රවයක් උපදිනවා ද ඒ හැම උපද්‍රවයෝ බාලයා නිසා උපදී. පණ්ඩිතයා නිසා නූපදිත්. යම්කිසි විපතක් සකස් වෙනවා නම් ඒ හැම බාලයා නිසා උපදී. පණ්ඩිතයා නිසා සකස් නොවේ. ගිණි ඇවිළැගත් බට සෙවිළි කළ ගෙයක්, තෘණ සෙවිළි කළ ගෙයක් තිබෙනවා නම්, ඇතුළත, පිටත සුණු පිළියම් කළ, වාතය වැළැක්වීමට ඇති දොරටු තිබෙනවා නම් ඒ වාතය ඇති ගෙවල් යම් සේ දවාද, එහෙයින්ම මහණෙනි, යම්කිසි භය කෙනෙක් උපදිනාහු ද ඒ හැම බාලයා නිසා උපදිති. පණ්ඩිතයා නිසා නූපදී. යම්කිසි උපද්‍රවයක් උපදිනවානම්, විපතක් හටගන්නවා නම් ඒ හැම බාලයා නිසා උපදී පණ්ඩිතයා නිසා නූපදී.

මහණෙනි, මේ බාලයා 'සප්‍රතිභය' වෙයි. විශාල වශයෙන් භය ඇති කෙනෙක් වෙනවා. පණ්ඩිතයා 'අප්‍රතිභය' වෙයි. පණ්ඩිතයා නිසා භයක් හට නොගනී. පණ්ඩිතයා භය නැති කෙනෙක් බවට පත් වෙනවා. බාලයා උපද්‍රව සහිත වෙනවා. පණ්ඩිතයා උපද්‍රව රහිත වෙනවා. (අනුපද්‍රව) බාලයා විපත් සහිත කෙනෙක් වෙනවා. පණ්ඩිතයා විපත් රහිත කෙනෙක් වෙනවා.

මහණෙනි, පණ්ඩිතයා නිසා භයක් නැත. පණ්ඩිතයා නිසා උපද්‍රවයක් නැත. පණ්ඩිතයා නිසා විපතක් නැත. එහෙයින් මහණෙනි, මෙහිලා පණ්ඩිතයෙක් වන්නෙමියි වීමංසක වන්නේ නම්, එනම් ධර්ම ඥාණයෙන් මනාකොට සිහිය පිහිටුවා ගන්නෙමි'යි හික්මිය යුතුය. මහණෙනි, නුඹලා විසින් එනම් භික්ෂු, භික්ෂුණී, උපාසක - උපාසිකාවන් විසින් මෙසේ හික්මිය යුතුය.

මෙහි බාලයා යනු සතර සතිපට්ඨානයට අනුව සිහිය පවත්වා නොගත් පුද්ගලයාය. සතර සතිපට්ඨානයෙන් මනාකොට පුරුදු කරන ලද සිතක් ඇති පණ්ඩිතයා නුවණැති කෙනෙක්. නමුත් බාලයා සිතන දේ, කියන දේ, කරන දේ හැම දෙයක්ම ඔහුටත්, අන් අයටත් විපත් පිණිසයි, කරදර පිණිසයි, දුක් සහගත පිණිසයි.

සතර සතිපට්ඨානයෙන් පුරුදු කරන ලද සිහිය නොමැති වුණාම ඔහුගේ සිහිය මේ ආකාරයයි. (මෙය සූත්‍ර දේශනාවෙහි සඳහන් නොවේ.) බුදුරජාණන් වහන්සේ බාල පණ්ඩිත සූත්‍ර දේශනාවෙහි බාල වර්ගයට අයත් යයි සඳහන් වන්නේ,

- ★ **දුච්චින්ති ච චින්ති හොති** - නිතරම නරක දෙයක්. (අයහපත්) ගැනමයි සිතන්නේ.

- ★ **දුබ්භාසිතභාසී හොති** - නරක දෙයක්මයි (අයහපත් දේ) කථා කරන්නේ.

- ★ **දුක්කත කම්මකාරී** - දුශ්චරිත දෙයක්මයි කරන්නේ.

මෙය සඳහන් කරන්නේ බාල ලක්ෂණ ලෙසටයි.

භාග්‍යවතුන් වහන්සේ අපට ආරාධනා කරනවා, ඔබ වීමංසක වන්න. මම බාලයෙක් නොවෙමි. පණ්ඩිතයෙක් වන්නෙමි.



පණ්ඩිත ලක්ෂණ මොනවාදැයි විමසා බලමු.

**සුචින්තිච චින්ති හෝති**
**සුභාසිතභාසී හෝති**
**සුබත කම්මකාරී හෝති**

යහපත් වූ දෙයක් ම සිතනවා. යහපත් (හොඳ) දෙයම කථා කරනවා. යහපත් වූ දෙයක්ම කරනවා. මෙසේ කරන්නේ සතර සතිපට්ඨානයට අනුව සිහිය පිහිටුවීමෙනුයි. නැත්නම් කය අනුව, විඳීම් අනුව, සිත අනුව, ධර්මතා අනුව සිත පිහිටුවා ගත නොහැකි වූ විට තුන්දොරින්ම දුෂ්චරිතයන්ට යොමු වෙනවා. නරක දෙයක්ම සිතන, කථා කරන, ක්‍රියා කරන ස්වභාවයට පත් වූ විට කයෙන්, වචනයෙන්, සිතෙන් සිදුවන සියළු අකුසල් ධර්ම සිද්ධ වෙනවා. එනම් දස අකුසල් සිදුවෙනවා.

මනාකොට සිහිය පිහිටුවන පණ්ඩිතයෙක් බවට පත්වුණාම ඒ අය කයෙහි ඇවතුම්, පැවතුම්, විඳීම් පිළිබඳව, සිත පිළිබඳව, ධර්මතා පිළිබඳව මනා අවබෝධයක් පවත්වන නිසා "**සුචින්ති ච චින්තී ච හෝති**", යහපත් වූ දෙයම සිතනවා. ආරම්මණයට සකස් වන්නේ කුසල මාර්ගයට යොමුවුණු දෙයක්මයි, කථා කරන්නෙත් එවැනි දෙයක්මයි. කුසල ආරම්මණය සකස් වුණාම වචනය සකස් වන්නේ කුසල ආරම්මණය ආශ්‍රය කරගෙනමයි. ඊළඟට සිතුවිලි කුසල ආරම්මණයක් වුණාම, වචනයත් කුසල ආරම්මණයට සම්බන්ධ වූ විට කර්මඵලයක් ලෙසින් ක්‍රියාව සකස් වෙන්නෙත් කුසල ආරම්මණයක් ලෙසිනුයි. එනම් '**සුබත කම්මකාරී**' යන අදහසයි.

එසේනම් බාලයා නිසා විපත් භය සහිතයි. දුක් සහිතයි. පණ්ඩිතයා නිසා භය රහිතයි. විපත් රහිතයි. දුක් රහිතයි. බාලයාට සප්‍රතිභය හටගනී. පණ්ඩිතයාට අප්‍රතිභය සකස් වේ.

භාග්‍යවතුන් වහන්සේ ආරාධනා කරනවා, ඔබ මෙහිලා පණ්ඩිත වන්නෙමි'යි වීමසංක වන්නෙමි'යි මනා වූ පරීක්ෂාකාරී නුවණින් යුතු වන්නෙමි' යි ඔබ විසින් හික්මිය යුතුය. ඒ භික්ෂුවක් වූ අපටත් උපාසක - උපාසිකා වූ ඔබටත්, භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද ආරාධනාවයි.

★ මෙසේ වදාළ කල්හි ආනන්දයෝ මෙසේ සැල කළහ. **භාග්‍යවතුන් වහන්ස, කොපමණකින් භික්ෂුවක් හෝ භික්ෂුණියක්, උපාසකයෙක් හෝ උපාසිකාවක් වීමංසක යැයි කියන්නට නිසි** වේද? එයින් අදහස් කළේ, විමසා බලා, සිහි නුවණින් කටයුතු කරන්නෙක් දැයි කියන්නේ කෙසේද?

මේ ආනන්ද ස්වාමීන් වහන්සේ විමසන්නේ පණ්ඩිත ලක්ෂණයි. පණ්ඩිතයෙක් වන්නට, වීමංසක කෙනෙක් වෙන්නට සිහිය පවත්වන්නේ කෙසේද'යි යනුවෙනුයි මේ ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රශ්න කරන්නේ?

බුදුරජාණන් වහන්සේ පැහැදිළි කරනවා, ආනන්දය, මහණ යම් හෙයකින් **ධාතු කුශල වේද, ආයතන කුශල වේද, පටිච්ච සමුප්පාද කුශල වේද, ස්ථානාස්ථාන කුශල වේද,** ආනන්දය, මෙතෙකින් භික්ෂුවක්, භික්ෂුණියක්, උපාසකයෙක්, උපාසිකාවක්, පණ්ඩිත යැයි, වීමංසක යැයි කියන්නට සුදුසුයි. (නිසි වෙයි)

දැන් අපි අප ගැන බලන්නට ඕන. මම පණ්ඩිත කෙනෙක් නම්, වීමංසක කෙනෙක් නම්, මේ මාර්ගය තුළ මේ කුශල ස්වභාවයෙන් හඳුන්වන දේ මා තුළ තිබෙනවාද? මා තුළ පවතින්නේ නැත්නම් සකස් කර ගත යුතුයි යන අධිෂ්ඨානය තිබිය යුතුය.

ආනන්දය, මේ **අටළොස් ධාතු** කෙනෙක් වෙති.

i. **චක්ඛු ධාතු**
ii. **රූප ධාතු**
iii. **චක්ඛු විඥාන ධාතු**
iv. **ශෝත්‍ර ධාතු**
v. **ශබ්ද ධාතු**
vi. **ශෝත්‍ර විඥාන ධාතු**
vii. **ඝාණ ධාතු**
viii. **ගන්ධ ධාතු**
ix. **ඝාණ විඤ්ඤාණ ධාතු**
x. **ජිව්හා ධාතු**
xi. **රස ධාතු**



xii. **ජිව්හා විඥාන ධාතු**
xiii. **කාය ධාතු**
xix. **ඵොට්ඨබ්බ ධාතු**
xx. **කාය විඤ්ඤාණ ධාතු**
xxi. **මනෝ ධාතු**
xxii. **ධම්ම ධාතු**
xxiii. **මනෝ විඤ්ඤාණ ධාතු**

ආනන්ද, යම් හෙයකින් මේ අටලොස් ධාතූන් දනී ද, දකී ද, ඒ දෙකම මනා කොට අවශ්‍යයයි. **යතො ජානාති (දනී), පස්සති (දකී). පස්සති** යනු ඇස් දෙකෙන් දකින දැක්මට වඩා විදර්ශනා නුවණට හසු කර ගෙන ඇති කර ගන්නා වූ දැකීමයි. මෙය අටලොස් ධාතු ගැන දැනුම පමණක් නොව විදර්ශනාවෙන් දැක ගැනීමක් තිබිය යුතුයි. එය ඔබ දැක තිබෙනවාද යන්න නුවණින් විමසා බලමු. නැත්නම් දැනුමට පමණක් සීමා වෙනවා.

චක්ඛු ධාතු දකින්නේ කොහොමද? රූප ධාතු, විඤ්ඤාණ ධාතු අවශ්‍ය පරිදි අපි බලමු. චක්ඛු ධාතුව කියන්නේ ප්‍රධාන වශයෙන් පඨවි, අපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතූන්ගෙන් නිර්මාණය වූ සංඛතයක් සංඛාරයක් වන අතර එහි ස්වභාවය උප්පාද, ඨිති, භංග (හට අරගෙන බිඳී වෙනස් වෙලා යනවා.) අනවබෝධය පැවතුණොත් චක්ඛු ධාතුව, ආත්ම සංඥාවට හසුකර ගන්නවා. සක්කාය දිට්ඨියට බැඳ තබනවා. එතැනට 'මම' කියලා සම්මුති නාමය යොදනවා. අනවබෝධය තිබුණොත් මේ 'මම' 'සත්ත්වයෙක්, පුද්ගලයෙක්, හැටියට' අපි නාමයක් යොමු කරනවා. මෙතැනදී නාම-රූප ධර්ම සකස් වෙනවා. මේ සිතාගත් දෙය නාමය වෙනවා. ඒ සිතුවිල්ල සමගින් එය වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර වශයෙන් සකස් වෙනවා. ඊළඟට ඇසෙහි, පඨවි .... ආදී වශයෙන් හසුවන දේ රූපය ලෙසින් සලකනවා. එහෙත් මේ ඇස සංඛතයක්. හටගත්ත වගේම නැතිවෙලා යනවා. මේ තුළ මම නැහැ. මගේ නැහැ. සත්ත්වයෙක්, පුද්ගලයෙක් නොවේ. නාම - රූප දෙක පමණයි. ඒ නාම - රූප හටගත්තා වගේම නැතිවෙනවා. එනම් අනිච්ච - දුක්ඛ, අනත්ත ත්‍රිලක්ෂණ ධර්මයට යටත් වෙනවා. මේ ඇස විදර්ශනාවේදී උදයව්‍යයට හසු කර ගන්න කොට අප දකින්නේ චක්ඛු ප්‍රසාදයයි. එනම් මූල බීජයයි. මූල ධාතුවයි. ඒ

ආකාශ, විඤ්ඤාණ යන දෙක මෙතැනදී ධාතුවක් ලෙසිනුයි සඳහන් කළේ.

මේ ධාතු, ස්කන්ධ, ආයතනයන් ගෙන් සමන්නාගත පුඤ්ජය පවත්වන විට මේ ශරීරයේ සිදුරු බව, හිස් බව අවශ්‍යයි. එය ආශ්වාස, ප්‍රශ්වාස සමඟිනුයි සකස් වී තිබෙන්නේ. වායො ධාතුව වෙනම සඳහන් කළත්, විශේෂයෙන්ම සිදුරු බව සකස් වන තැන්වලත්, ජීවිත ඉන්ද්‍රිය පවත්වා ගැනීමේදීත්, ඉන්ද්‍රිය ධර්ම පවත්වා ගැනීමේදීත්, එහි සකස් වීමක් තිබෙනවා. මේ හිස් බව ආකාශ ධාතු ලෙසින් විශේෂයෙන්ම පෙන්වා දෙනවා.

**විඤ්ඤාණ** ධාතුව පැහැදිළියි. විඤ්ඤාණය කියන්නේ, **'ආරම්මණ විජානන ලක්ඛණං චිත්තං'** - අරමුණු දැනගෙන තීරණය කිරීම විඤ්ඤාණයි. සංඥාවෙන් හඳුනා ගන්නවා. විඤ්ඤාණය තීරණය කරනවා.

★ **භාග්‍යවතුන් වහන්ස, යම් කෙනෙක් ධාතු කුශල මහණ යැයි කියන්නට තවත් කරුණු තිබෙනවාද?**

ආනන්දය, වන්නේය. ආනන්දය, මේ ධාතුන් සය දෙනෙක් වෙති.

| | |
|---|---|
| ★ **සුඛ ධාතු** | ★ **දෝමනස්ස ධාතු** |
| ★ **දුක්ඛ ධාතු** | ★ **උපේක්ඛා ධාතු** |
| ★ **සෝමනස්ස ධාතු** | ★ **අවිද්‍යා ධාතු** |

භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා, **සුඛ ධාතු** පිළිබඳව. එතැනදී සැප කියන විඳීම, ඒ අරමුණ, ඉෂ්ඨ ආරම්මණයක්, ධාතුවක් ලෙසිනුයි සඳහන් කළේ. ධාතුවක් යනුවෙන් සඳහන් කළේ එහි මූල බීජයක් තිබෙනවා, නිර්මාණ ශක්තියක් තිබෙනවා. යමකට මුල් වෙනවා. මේ සුඛ ධාතුවෙන් පුළුවන් සුඛ ආරම්මණය ඉදිරියට අරගෙන යන්න. සැපයි, සැපයි කියන දේ තුළ ඇලුණොත් එය නිමිති අරගෙන, රාග, ලෝභ, අභිජ්ඣා වශයෙන් සකස් වෙනවා. නමුත් මේ සුඛ ආරම්මණය විදර්ශනාවට යොමු කළොත් ඒ සැපය, දුකට පෙරළෙනවා කියන අදහසින් දකින්න පුළුවනි. ඒ නිසා එය සුඛ ධාතුවක් ලෙසින්



සඳහන් කළා.

**දුක්ඛ ධාතු** : අනිෂ්ට අරමුණයි මෙයත් වෙනස්වීමෙන් ශූන්‍ය ස්වභාවයට පත්වෙනවා

**සෝමනස්ස ධාතු** : සුඛ ධාතුවට වඩා සෝමනස්ස කියන තැන ඉන් ඉදිරියට යනවා. දැන් ධර්මානුකූලව ගත්තොත් නිරාමිස ප්‍රීතියකට යනවා. අභිධර්මයේදී කාමාවචර කුශලයක් ලෙස සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත මුලින්ම සඳහන් කරනවා. යම් වූ කුසල ක්‍රියාවක්, සුඛ ධාතුවට වඩා ඉහළට ගිය සොම්නසින් යුතුව සිදු කිරීමයි. එතැනදී බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය ඇති කරගන්නේ මේ ආකාරයටයි.

**"සො අවෙච්චප්‍රසාදෙන සමන්නාගතොම්හි (අචල ප්‍රසාදයකින් යුක්ත වූයේ) ලභති අත්ථවේදං, ලභති ධම්මවේදං, ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං, පමුදිතස්ස පීති ජායති මනස්ස තායො පස්සම්භති පස්සද්ධ කායො සුඛං වේදේති සුඛිතෝ චිත්තං සමාධියති."**

අර්ථ වශයෙන් ලබනවා. ධර්ම වශයෙන් ලබනවා. ධර්මය ආශ්‍රය කරගෙන සතුටු වෙනවා. ප්‍රමෝදය නිසා ප්‍රීතිය උපදිනවා. ඒ සඳහන් කළේ සොම්නසයි, ප්‍රීතිය හටගත්තම කයත් නිරෝගී වෙන්න පටන් ගන්නවා. **(පීති මනස්සකායො පස්සම්භති)**

මෙතැනදී සෝමනස්ස යයි, ප්‍රීතියයි දෙකක් ලෙසයි දැක්වූයේ. සුඛ ධාතුව සහ සෝමනස්ස ධාතුව දෙකක් ලෙසයි සැලකුවේ. සොම්නස කියන්නේ සතුටට වඩා ප්‍රබලව ඇතිවුණු දෙයක්. සතුටින් සිටිනවාට වඩා සොම්නසින් සිටිනවා යයි සඳහන් කළොත් ඊට වඩා ඉහළට යන අදහසක් තිබෙනවා.

★ **දෝමනස්ස ධාතු** : දුකට වඩා ටිකක් ඉහළට ගිය තැනක් මේ දෝමනස්ස ධාතුව. මේ දොම්නස තමා වර්තමානයේ 'ආතතිය' යැයි සඳහන් කරන්නේ, 'දුක' සාමාන්‍යයෙන් හටගෙන, නැතිවෙලා යන්න පුළුවන්. නමුත් දොම්නස කියන කොට ඊට වඩා හිතේ ප්‍රබලව ඇතිවුණු දෙයක්.

චක්ඛු ප්‍රසාදයෙක් සකස් වන ධාතුන් ද, ස්කන්ධ ද, ආයතන ද, චක්ඛු ඉන්ද්‍රිය වශයෙන් ඒ සියල්ලම අනිච්ච, දුක්ඛ, අනත්ත ත්‍රිලක්ෂණ ධර්මයට යටත්ය එවිට මෙහි සත්ත්වයෙක්, පුද්ගලයෙක් යනුවෙන් යමක් නැත. නිත්‍යයි, සුබයි, ආත්මයි වශයෙන් උපාදානයට කිසිවක් නැත. ඒ සඳහා ඇලෙන්න, බැඳෙන්න, ගැටෙන්න යමක් නැත. ඒ නිසා එය ශුන්‍යතයි. මේ අදහස ඔබට වැටහෙන්න ඕන. එයයි දකින්න ඕන.

**ජානාති පස්සති** - දනී ද දකී ද, (දන්නවද, දැනෙනවද, දකිනවද) යන අදහසයි.

මේ සඳහන් කළ අදහස විදර්ශනාවෙන් වැටහෙනවා. මීට වඩා හාත්පසින්ම මේ අදහසම, වචන වලින් වෙනස් වෙන්න පුළුවනි. ඔබට වැටහෙන ආකාරයට දකින්න පුළුවනි.

නිදසුනක් ලෙසින්, චක්ඛු ප්‍රසාදය තිබෙන විට, ඔබට සංචේතනා වශයෙන් ඇසින් දුටු බොහෝ දේවල් සකස් වුණු දේවල්,  ආරම්මණ සිතට එන්න පුළුවනි. මේ චක්ඛු ප්‍රසාදය තුළ සංචේතනික වශයෙන් සකස් වුණු දේවල් තියෙනවා. ඔබේ ජීවිතවල ලොකු දුව, පොඩි දුව, ලොකු පුතා ....... ගහකොළ, ගේ දොර ආදී වශයෙන් හා මේ අතර අධ්‍යාපනික, ලෞකික දේවල් තිබෙනවා. එවිට මේ දේවල් සියල්ලම අපි චක්ඛු ප්‍රසාදයේදී මෙයට යටත් කර ගන්නවා. චක්ඛු ප්‍රසාදයට දැනුණු හසුවුණු මේ සියල්ලම අනිච්ච, දුක්ඛ, අනත්ත ත්‍රිලක්ෂණ ධර්මයට යටත් බව මෙනෙහි වෙනවා. එවිට චක්ඛු ධාතුවයි, රූප ධාතුවයි, චක්ඛු විඤ්ඤාණ ධාතුවයි තුනම දැන් එකටම වැටහෙනවා. ඒ හැම දෙයක්ම "**යද නිච්චං තං දුක්ඛං - යං දුක්ඛං තද නත්තා**"

**"රූපං අනිච්චං පටිච්චසමුප්පන්නං ඛය ධම්මං, වය ධම්මං, විරාග ධම්මං, නිරෝධ ධම්මං".**

දැන් බලන්න, අපි ධාතුවක් වශයෙන් ගත්තේ එකයි. අටලොස් ධාතු වශයෙන් මේ සියල්ලම මේ විදියට මෙනෙහි වෙන්න ඕන. විදර්ශනාවෙන් දැකගෙන එය පුළුවන් තරම් භාවිතයෙන් දැක ගන්න හැකි වෙන්න ඕන. එසේ නැත්නම් '**අරිය ධම්මස්ස අකෝවිදෝ** - ආර්‍ය ධර්මය දැකගන්නට දක්ෂ නැහැ.



**අරිය ධම්මේහි අවිනීතෝ**. ආර්ය ධර්මයෙහි අවිනීතයි. අකුසලයට යොමුවෙනවා. ප්‍රමාදී වෙනවා. අවබෝධය නැති වූ විට, නොදන්නා කම නිසා, නොදැනගෙන නිසා, ආරම්මණයෙහි ඇලෙනවා, බැඳෙනවා, ගැටෙනවා, එතකොට තමා අවිනීත කෙනෙක් වෙන්නේ. විදර්ශනාවෙන් දැකගත හැකි දක්ෂ කෙනෙක් වූ විට, **සුතවා අරිය සාවකෝ, අරියානං දස්සාවි, අරිය ධම්මස්ස කෝවිදෝ, අරිය ධම්මේහි සුවිනීතෝ** කෙනෙක් බවට පත් වෙනවා. එවිට මේ දැනුම **ජානාති, පස්සති** දන්නවා, දකිනවා කියන අවස්ථා දෙකම මේ අටලොස් ධාතු වලින්ම සකස් වෙන්න ඕන. ධාතු කුශල, පණ්ඩිත, වීමංසක යනුවෙන් සඳහන් කරන්නේ ඒ පුද්ගලයනුයි. අපත් පණ්ඩිත කෙනෙක් වෙන්න නම්, (ධාතුකුශල වීමංසක වෙන්න නම්) මේ අටලොස් ධාතුන් විදර්ශනාවෙන් දැකගන්න පුළුවන්කම තිබිය යුතුයි.

★ **භාග්‍යවතුන් වහන්ස, යම් කරුණකින් ධාතු කුශල මහණ යැයි කියන්නට නිසි වේද, එබඳු අන් කරුණක් වන්නේද?**

ආනන්ද ස්වාමීන් වහන්සේ, බුදුරජාණන් වහන්සේ ගෙන් විමසනවා, භාග්‍යවතුන් වහන්ස, ධාතු කුශල භික්ෂුවක්, භික්ෂුණියක්, උපාසකයෙක්, උපාසිකාවක් කියන්නේ කොහොමද? එබඳු අන් කරුණක් තිබෙනවාද? අටලොස් ධාතුව පිළිබඳව ඉහත සඳහන් කළානේ. මේ විමසන්නේ තවත් එබඳු කරුණු තිබෙනවාද?

ආනන්දය, වන්නේය, ධාතුහු සය දෙනෙකි.

★ **පඨවි ධාතු**
★ **අපො ධාතු**
★ **තෙජො ධාතු**
★ **වායො ධාතු**
★ **ආකාශ ධාතු**
★ **විඤ්ඤාණ ධාතු**

සාමාන්‍යයෙන් අප නිතර කථා කරන ධාතු කොටස් හතර, **සතර මහා භූත ධර්ම** යනුවෙනුයි සඳහන් කරන්නේ. මෙතැනදී **ආකාශ ධාතු, විඤ්ඤාණ ධාතු** වශයෙන් තව දෙකක් එකතු කරගෙන තිබෙනවා. ආකාශ යනු හිස් බව, කන් සිදුරු තුළ, නාස් සිදුරු තුළ ඇති හිස් බව. මේ ධාතූන් පිළිබඳවත් විදර්ශනා ප්‍රඥාවෙන් දැන ගැනීමක්, දැක ගැනීමක් අපට තිබිය යුතුය.

**උපේක්ඛා ධාතු** : මෙය මධ්‍යස්ථ සුඛ, එනම් අදුක්ඛම සුඛයයි.



**අව්‍යාපාද ධාතුව** : තරහ නැති බවත් ධාතුවක්. එය යහපත් වූ සිතුවිල්ලකි.

**විහිංසා ධාතුව** : හිංසාවත් ධාතුවක්.

**අවිහිංසා ධාතුව** : හිංසා නැති බවත් ධාතුවක්. මෛත්‍රී සහගත සිතයි.

භාග්‍යවතුන් වහන්සේ ධම්ම පද ගාථාවන්හිදී දේශනා කරනවා

**සුප්පබුද්ධං පබුජ්ඣන්ති**
**සදා ගෝතම සාවකා**
**යේසං දිවාච රත්තෝච**
**අහිංසාය රතෝමනෝ**

(ජේතවන - දාරුසරික ඇරඹ)

යම් කෙනෙකුට අවිහිංසා සිතුවිල්ලෙන් (හිංසා සිතුවිලි නොමැති) ඒ ආරම්මණය නිතර පවත්වා ගත හැකි නම්, ඒ බුද්ධ ශ්‍රාවකයෝ සුවසේ නිදා සුවසේ පිබිදෙයි. ඒ සඳහන් කළේ නිරන්තරයෙන් සුවපත් වූ ජීවිතයක් ගත කරනවා යන අදහසයි. '**රතෝ මනෝ**' - මනස එයට ඇල්මක් ඇති කරනවා. දිවා - රාත්‍රී යනු නිතරම අවිහිංසා අරමුණෙහිම පවත්වනවා නම් ගෞතම ශ්‍රාවකයෝ සුවසේ නිදා සුවසේ පිබිදෙනවා. ජීවිතය සුවපත් ව පවත්වනවා.

මේ ධර්ම මාර්ගය තුළ අපව හැම තැනකින්ම '**සම්පහන්සේසි**' කියන තැනට ගෙන එනවා. ප්‍රහර්ෂයක්, එනම් ධර්මයෙන් ලබන සැනසිල්ලක් අපේ සිත්වලට දැනෙනවා.

- ★ සන්දස්සේසි
- ★ සමාදපේසි
- ★ සමුත්තේජේසි
- ★ සම්පහංසේසි

සන්දස්සේසි කියන්නේ අපට භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ දහම් ඇසෙනවා. දැන් අපට ඇසෙන මේ ස්වාමීන් වහන්සේගේ හඬ සංකේතවත් වුණාට මේ දහම් පරියාය ඔස්සේ ඔබට දැනෙන්න ඕන. ඇසෙන්න ඕන. භාග්‍යවතුන් වහන්සේගේ හඬ. එයයි **සන්දස්සේසි** යනුවෙන් සඳහන් කළේ.

**සමාදපේසි** : අපි එහි පිහිටන්න ඕන. එහි සමාදන් වෙන්න ඕන.

**සමුත්තේජේසි** - අප එහි උන්දු වෙන්න ඕන. උනන්දු කරන්න ඕන.

**සම්පහංසේසි** - ධර්මයෙන් ලබන ප්‍රහර්ෂය සකස් වෙන්න ඕන.

මේ ධාතූන් ගෙන් අයහපත් (නරක) කොටස අපි අනිෂ්ට ආරම්මණය ලෙස දැක අපේ හිත් සකස් කර ගන්න ඕන. එයින් බැහැර වන්නට. බැහැර වන්නේ කෙසේද?

වරු ගණනාවක් පුරා පිපාසිතව සිටි යම් පුද්ගලයෙක්, වතුර විලක් හෝ වතුර භාජනයක් ළඟට ඇවිත් පැන් දෝතක් ගෙන බොන්න හදනවා. කෙනෙක් සඳහන් කරනවා, මෙය බොන්න එපා. මෙහි හලා - හල විෂ මිශ්‍ර වෙලයි තියෙන්නේ. එය ඇහුවම ඒ තැනැත්තා ජලය බොනවද? කොපමණ පිපාසය තිබුණත් ඒ අය බොන්නේ නැහැ. එය විෂ සහිත බව දන්න නිසා ඔහු බොන්නේ නැහැ.

ඒ වගේ මේ ධාතු දැන ගත්තට පස්සේ කාම ධාතු, ව්‍යාපාද ධාතු, විහිංසා ධාතු දැන ගත්තට පසුව හලා - හල විෂ වගේ දැන ගන්නවා; **විනිපාත නිරයං උප්පජ්ජන්ති**. බහුල ලෙස දුක් දෙන දුගතියට මග බව දැන ගන්නවා. එය දැනගෙන සිටින්න ඕන. දැන ගත්තේ නැත්නම් ඒ විෂ පානය කරනවා. ඒ වගේ මෙහි තිබෙන භයානක කම, විපාකය දැන ගන්න ඕන. විදර්ශනාවට යොමු කර ගත් විටයි නිසි ලෙස අවබෝධ වෙන්නේ. එයින් ප්‍රයෝජනයක් ඉන් ලබන්න පුළුවනි.



හොඳ දේත් දැනගන්න ඕන. නරක දේත් දැනගන්න ඕන. මෙහි ආදීනවය දැක නරක දෙයින් වළක්වා ගන්න අප ඉගෙනගත යුතුයි. හොඳ දේ, යහපත් දේ අනුගමනය කරන්න එහි ආනිසංසය ගැනත් දැනගත යුතුය. ආදීනවය ගැන සඳහන් කරන විටම එක් වරම මතුවන්නේ නරක, අයහපත පිළිබඳවයි. නමුත් ආනිසංස ගැන සඳහන් කරන විට එක් වරම මතු වන්නේ, යහපත, හොඳ පිළිබඳව. මේ දෙපැත්තටම සම්බන්ධය තිබෙනවා. නමුත් ප්‍රධාන වශයෙන්ම ආදීනවය ගැන සඳහන් කරන කොටම හිතට මතුවන්නේ අයහපත ගැනයි.

**අස්සාදාය, ආදීනවය, නිස්සරණය.**

මේ සංඛත ලෝකය එනම් මේ පැවැත්ම තුළ අස්සාදය දකිනවා. එහි ආදීනවය, අනිත්‍ය ස්වභාවය දැක අත් හරිනවා, ආශ්‍රය නොකර සිටිනවා, එය නිස්සරණයයි.

★ **නැවතත්, ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රශ්න කරනවා. වහන්ස, යම් කරුණකින් ධාතු කුශල මහණ යැයි කියන්නට නිසිවේද? එබඳු තවත් කරුණු තිබෙනවාද?**

ආනන්ද ධාතු තිදෙනෙක් වෙති. **කාම ධාතු, රූප ධාතු, අරූප ධාතු**. කාම ලෝකයට අයත් සියලුම ධාතු කාම ධාතු. රූප ලෝකයට (බ්‍රහ්ම ලෝක) අයත් සියලුම ධාතු, රූප ධාතු. අරූප ලෝකවලට සම්බන්ධ සියලුම ධාතු අරූප ධාතු.

★ **නැවතත් ප්‍රශ්න කරනවා, වහන්ස, යම් කරුණකින් ධාතු කුශල මහණ යැයි කියන්නට නිසිවේද? එබඳු අන් කරුණක් වන්නේද?**

ආනන්දය, මේ ධාතුහු දෙදෙනෙක් වෙති. **සංඛත ධාතු, අසංඛත ධාතු** වේ. සංඛත යනු හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දේවල්. එනම් සවිඤ්ඤාණක සහ අවිඤ්ඤාණක සියළුම දේවල්. අසංඛත නම් එකම දේ නිවනයි.

★ **යළි වහන්ස, කීපමණෙකින් 'ආයතන කුශල' මහණ යැයි කියන්නට නිසිවේද?**

මුලදී සඳහන් කළේ, 'ධාතුකුශල' පිළිබඳවයි. දැන් මේ සඳහන් කරන්නේ '**ආයතන කුශල**' පිළිබඳවයි.

ආනන්දය, ආධ්‍යාත්මිකව, බාහිර වූ ආයතනයෝ හය දෙනෙක් වෙති.

- ★ ඇස ද රූපයෝ ද
- ★ කණ ද ශබ්දයෝ ද
- ★ නාසය ද ගන්ධයෝ ද
- ★ දිව ද රසයෝ ද
- ★ කය ද ස්පර්ශයෝ ද
- ★ සිත ද ධර්මයෝ ද වශයෙනි.

ආනන්ද, මේ ආදී වශයෙන් ආධ්‍යාත්මික, බාහිර ආයතන හයක් තිබෙනවා. මේ හය යුගල වශයෙනුයි පවතින්නේ. ඇසයි - රූපයයි, ආධ්‍යාත්මික - බාහිර ආයතනයි. ඇස නම් ආයතනයක් හැටියට අසා තිබෙනවා. මෙතන දී රූපයත් ආයතනයක්. ඒ වගේම කණයි, ශබ්දයයි ආයතනයක් නාසයයි, ගන්ධයයි ආයතන. ආදී ඉතිරි යුගලයන් ද ආයතන ලෙසින් දක්වනවා.

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම ආදිය ධර්මයේදී යම් විටක ආයතන වශයෙනුත්, තවත් තැනකදී ධාතු වශයෙනුත් හඳුන්වනවා.

★ **යළි වහන්ස, කොපමණකින් "පටිච්ච සමුප්පන්න කුශල' මහණ යයි කියන්නට නිසි වේද?**

දැන් ප්‍රශ්න කරන්නේ පටිච්ච සමුප්පාද ධර්මය අනුව මේ මහණ හඳුන්වන්නේ කොහොමද? සරලව සඳහන් කළොත් පටිච්ච සමුප්පාද ධර්මයයි මෙතනදී මතු වන්නේ 'පටිච්ච සමුප්පාද කුශල' යනුවෙන් සඳහන් වන්නේත් එයයි. මේ ශාසනයේ මහණ යැයි සඳහන් කරන විට, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිවු පිරිසම අයත් වෙනවා.

මේ සස්නෙහි මහණ මෙසේ දැන ගනී. අවිද්‍යාදී ප්‍රත්‍යය ඇති කල්හී සංස්කාර ඵලය වෙයි. අවිද්‍යාදී ප්‍රත්‍යය නිසා



සංස්කාර උපදී. අවිද්‍යාදී ප්‍රත්‍යය නැති කල්හි සංස්කාර ආදී ඵලය නැතිවෙයි. මේ අවිද්‍යාදී ප්‍රත්‍යයාගේ අනුත්පාද නිරෝධයෙන් සංස්කාර ආදී ඵලය නිරුද්ධ වෙයි. ඒ සඳහන් කළේ, මේ අවිද්‍යාදී ප්‍රත්‍යයාගේ අනුත්පාද නිරෝධයෙන් අවිද්‍යාදී ප්‍රත්‍ය උපදින්නේ නැතිව නැතිවෙලා යනවා නම් මේ සංස්කාර ආදී ඵලය නිරුද්ධ වෙනවා. අවිද්‍යාව කියන ප්‍රත්‍ය උපදින්නේ නැත්නම් උපදින්නේ නැතිව නිරෝධ වෙනවා නම්, අවිද්‍යාව උපදින්නේ නැහැ, හටගන්නේ නැහැ. උපදින්නේ නැහැ යනුවෙන් සඳහන් කළේ, නැතිවෙලා, නිරෝධයට පත්වෙලා තියෙනවා නම් සංස්කාර ආදී ඵලය නිරුද්ධ වෙනවා. එනම් සංස්කාර නම් වූ ඵලය හටගන්නේ නැහැ. ඒ කෙලෙසද? අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ සකස් වෙනවා සංස්කාර ප්‍රත්‍යයෙන් විපාක විඤ්ඤාණය වෙයි. විඤ්ඤාණය විපාක දෙන ආකාරයට වෘද්ධියට එනවා. රහත් ඵලයට පත් වූ පසු මෙය සිදුවන්නේ නෑ. ඇයි? සංස්කාර හට නොගන්න නිසා විඤ්ඤාණ විපාක වශයෙන් සකස් නොවේ. රහතුන් වහන්සේටත් විඤ්ඤාණය තිබෙනවා. නමුත් ප්‍රතිසන්ධි විඤ්ඤාණය රහතුන් වහන්සේට සකස් කිරීමක් නැහැ. රහත් වෙලා අවසන් නිසා පටිසන්ධි විඤ්ඤාණයක් හට ගන්නේ නැමැ. සංස්කාර තිබුණොත් තමයි විඤ්ඤාණ විපාකය වශයෙන් පටිසන්ධියක් දෙනු ලබන්නේ.

පටිසන්ධි විඥාත ප්‍රත්‍යයෙන් නාම - රූප වෙයි. නාම - රූප ප්‍රත්‍යයෙන් ෂඩ් ආයතන (ඇස, කණ, නාසය, දිව, ශරීරය, මන) වෙයි. ෂඩ් ආයතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි. (ඇසට - රූප කණට - ශබ්ද වශයෙන්) ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වෙයි. (සැප, දුක්, මධ්‍යස්ථ) වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. (දැඩිව ගන්නවා) උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. කර්ම භවයෙන් ජාතිය වෙයි. ඒ භවය කර්ම භවයක් වෙලා තියෙන්නේ කොහොමද?. මේ උප්පත්ති භවය කර්මාණුරූපව, භවය සකස් වීමයි. කර්ම භවය කියලා කියන්නේ පින් කළ අය සුගතියටත්, පව් කළ අය දුගතියටත් සකස් කරනවා. එයට කියනවා කර්ම භවය කියලා. කර්ම භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාස හටගනී. මෙසේ යථොක්ත අසම්මිශ්‍ර දුක්ඛ සමුදයාගේ සකස්වීම සිදුවේ.

මේ අකාරයට මේවා මිශ්‍ර වීමෙන් (එකට එකතුවීමෙන්) දුක හට ගැනීමේ සම්භවයක් සකස් වෙනවා. යළි අවිද්‍යාවෙන් ම විරාග සංඛ්‍යාත මාර්ගයෙන් අශේස නිරෝධය හේතු කොට ගෙන අකුසල් නැතිවීම කුසල් පක්‍ෂයට යොමු වෙනවා. (නිවන් මගට) අවිද්‍යාවෙන් හටගත් හැම දෙයක්ම නැති වෙනවා. කියන අවබෝධය නැති තැන විරාග සංඛ්‍යාත මාර්ගයෙන් අශේෂ නිරෝධ හේතු කොට ගෙන සංස්කාරයන්ට අනුප්පාද නිරෝධය වෙයි. සංස්කාරයන්ගේ නිරෝධයෙන්, විඤ්ඤාණයෙන් නිරෝධ වෙයි.

අවිද්‍යවෙන් පටන් ගෙනයි මේ තත්වයට පැමිණිය යුතු වන්නේ. අශ්‍රැතවත් පෘථග්ජන ස්වභාවයේ සිටයි මේවා දැකිය යුත්තේ. නැත්නම් රහත් ඵලයට පැමිණි පසු අමුතුවෙන් දකින්න දෙයක් නැහැ. නිරෝධ සමාපත්තියට පමණයි පැමිණෙන්න තියෙන්නේ. අපි දැන් මේ තත්වයේ ඉඳගෙන හැකිතාක් දුරට සෝතාපන්න නොවුණ චූල සෝතාපන්න කෙනෙක් ස්වභාවයටවත් පවතින්න ඕන. සෝවාන් ඵලයට පත් වූ කෙනෙක් ලෙස හිතන්න පුළුවන්කම ලැබෙන්න ඕන. සක්කාය දිට්ඨිය නැති කළා නම් මම කොහොමද සම්මුතිය තුළ මම ගැන සිතන්නේ. මම යනුවෙන් පවත්වා ගත්තාට මම - මාගේ කියලා පරමාර්ථ වශයෙන් මෙතනදී පවතින්නේ ධාතු, ආයතන, ස්කන්ධ පමණයි. මම යනුවෙන් ස්ථිර සත්ත්වයෙක් පුද්ගලයෙක් නැති බව දැක ඇසෙන් පුද්ගලයෙක් නැති බව දැක ඇසෙන් රූප ගන්නා විට, කණෙන් ශබ්ද අසන විට, නාසයෙන් ආඝ්‍රාණය කරන විට, දිවෙන් රස, ..  කයෙන් ස්පර්ශ.. මනසින් සිතුවිලි වශයෙන් ගන්නා විට කෙලෙස් රහිතව දැකගන්න පුළුවන්කම ලැබෙන්න ඕන. සෝතාපන්න වුණත් කාමරාඝ, පටිඝ, රූප රාග තිබෙනවා නමුත් පාපයකට හසුනොවී, සන්සිඳුණු ස්වභාවයෙන්, හැකිතාක් දුරට කෙලෙස් රහිතව සෝතාපන්න ස්වභාවයෙන් පවත්වන්න පුළුවනි.

මේ අකාරයෙන් දකින්න, චූල සෝතාපන්න ස්වභාවයෙන් පවත්නා ගන්න පුළුවනිද යන්න. මේ සම්මුතියෙහි දුවේ, පුතේ කියලා කථා කරන විට ඇයි මගේ අම්මා, අප්පච්චි කිවුවත් එවැනි වේලාවක පවා සෝතපන්න ස්වභාවයෙන් දකින්න ඕන. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් මේ අම්මා, අප්පච්චි, හේතු



ප්‍රත්‍යයන්ගෙන් හටගත් මේ දුව පුතා, ස්වාමි භාර්‍යා හටගත්තා වගේම නැතිවෙලා යනවා ලෙඩ-දුක් දිරාගෙන යාම මරණය ඔස්සේ කර්මය අනුව එය සකස් වෙලා තියෙන්නේ මාර්ගයට උපකාරක ධර්මයක් ලෙසින් මේ සම්මුති සම්බන්ධය අනුව ස්වාමි භාර්යා වශයෙන් මම පිහිට වෙනවා. ඒ අදහසට සිත පුරුදු කළ  යුතුයි. එවිට අවිද්‍යාව නැති වී ගෙන, නැති වී ගෙන යන කොට විරාගයට පත් වෙනවා.

මේ විදියට දැකීමෙනුයි, දෙමව්පියෝ - දරුවෝ, ස්වාමි - භාර්යා ආදී වශයෙන් විරාගයට පත්වන්න පුළුවන්. අවිද්‍යාවෙන් විරාගයට එනවා. විරාග සංඛ්‍යාත මාර්ගයෙන් අශේෂ නිරෝධයට එනම් ශේෂයක් වත් ඉතිරි නොවන්න කෙලෙස් බැහැර වෙන්න ඕන. අශේෂ නිරෝධය හේතු කොට ගෙන සංස්කාරයන්ගේ අනුත්පාද නිරෝධය වෙයි. (සංස්කාර නැතිවීම) සංස්කාරයන්ගේ නිරෝධයෙන් විඤ්ඤානයාගේ නිරෝධය වෙයි. විඤ්ඤාණ නිරෝධයෙන් නාම - රූප නිරෝධය වෙනවා. නාම - රූප නිරෝධයෙන් ෂඩ් ආයතන නිරෝධය වෙනවා. රහත් උතුමෙකුට මේ ෂඩ් ආයතන නිරෝධ වෙනවා යනු ඇස, කණ, නසය, නොපෙනෙනවා කියන එක නොවේ. ඒවායින් කෙලෙස් හට ගැනීමක් නැති වෙනවා කියන එකයි. ෂඩ් ආයතනයන්ගේ නිරෝධයෙන් ස්පර්ශය නිරෝධ වෙයි. ස්පර්ශ නිරෝධයෙන් වේදනා වගේ නිරෝධ වෙයි. වේදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් උපාදානයන්ගේ නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භව නිරොධය වෙයි. භව නිරෝධයෙන් ජාති නිරෝධයෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, නිරෝධ වෙයි. මෙසේ අසම්මිශ්‍ර වූ යථොක්ත දුක්ඛ ආදී අනුත්පාද නිරෝධය වෙනවා. අසම්මිශ්‍ර වූ යනු කෙලෙස් සමග සම්බන්ධ නොවී නිකෙලෙස් මාර්ගයක, කෙලෙස් ගැලවෙන ආකාරයට එකිනෙක පවතිනවා. මේ චක්‍රය දම්වැලක් වගේ එකට - එක උත්පාද වුණු තැන නිරෝධ වෙන්න ඕනේ.

ආනන්දය, මෙතකින් පටිච්ච සමුප්පාද කුශල මහණ යැයි කියන්නට නිසි වෙයි. (පටිච්චසමුප්පාද කුශල මහණ බවට පත්වෙන්න සුදුස්සෙක් බවට පත් වෙනවා)

★ නැවතත් ප්‍රශ්න කරනවා. කුමන ආකාරයකින් ස්ථාන අස්ථාන මහණ යැයි කියන්නට සුදුසු වේද?

"ආනන්දය, මේ ශාසනයේ භික්ෂුවක් යම් කරුණකින් සෝතාපන්න ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් එකද සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේ නැත. එය එසේ වෙන්නේ නැත. නමුත් පෘථග්ජන අයෙක් සංස්කාරයන් නිත්‍ය වශයෙන් ගන්නා බව පැහැදිළියි. එමෙන්ම, මෙම මාර්ග දෘෂ්ඨි සම්පන්න ආර්‍ය්‍ය ශ්‍රාවකයා කිසිදු සංස්කාරයක් සුබ වශයෙන් ගන්නේ නැති බවට අවබෝධය ලබයි. එනමුත් පෘථග්ජන පුද්ගලයා යම් වූ සංස්කාරයක් සුබ වශයෙන් ගන්නා බවට නම් අවබෝධ කරගනී.

එමෙන්ම, මෙම කරුණ හේතු රහිතයි. උපකාරයක් නැත. එනම් ආර්‍ය්‍ය මාර්ගයට පත් වූ පුද්ගලයා කිසිදු ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේ ය යන්නයි. එය එසේ වන්නේ නැත. එනමුත් පෘථග්ජන පුද්ගලයා නම් කිසියම් ධර්මයක් ආත්ම වශයෙන්ද ගන්නේය. මේ දහම් පෙළෙහි සරල අදහස කුමක්ද? සෝතාපන්න හෝ ඉහළ මාර්ග ඵලාවබෝධයට පත් උතුමෝ කිසිදු සංස්කාරයක් නිත්‍යයි, සුබයි ආත්මයි වශයෙන් නොගන්නා බවටත් අශ්‍රැතවත් පෘථග්ජන පුද්ගලයා යම් වූ සංස්කාර ධර්මයන් නිත්‍යයි, සුබයි, ආත්මයි වශයෙන් ගන්නා බවත්ය.

තවත් කරුණක් අවබෝධ කොට ගත යුතුය. ඒ කුමක්ද? දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුද්ගලයා තම මව මරන්නේය යන කරුණ නොවන බවයි. එනමුත් පෘථග්ජන පුද්ගලයා නම් මව මරන්නේය යන කරුණ පවතින බවට අවබෝධය ලැබගනී.

එමෙන්ම මෙම කරුණ අස්ථානයි. එනම්, යම් හෙයකින් සෝවාන් පුද්ගලයා විසින් පියාගේ ජීවිතය නැති කරන්නේය යන්නයි. මෙම කරුණ නම් සිදුවෙයි. එනම් යම්හෙයකින් පෘථග්ජන පුද්ගලයා විසින් පියාගේ ජීවිතය තොර කරන්නේය යන කරුණයි. නැවතත් මෙසේ දේශනා කරනවා. යම්හෙයකින් සෝවාන් පුද්ගලයා රහතුන්ගේ ජීවිතය නැති කරන්නේය යන කරුණ නොවන බවය. එනමුත්, යම් කරුණකින් පෘථග්ජන පුද්ගලයා රහත්හුගේ ජීවිතය නැති කරන්නේය යන කරුණ වන



බවය.

මෙම සඳහන් කරුණත් විමසා බලන්න.

එනම්, මාර්ග දෘෂ්ටියෙන් යුතු පුද්ගලයා දූෂ්‍ය වූ සිතින් තථාගතයන් වහන්සේගේ සිරුරෙහි ලේ සොලවන්නේය යන කරුණ නොවන බවයි. එනම් ලේ උපදවන්නේය යන කරුණ නොවන බවයි. එනමුත් පුහුදුන් පුද්ගලයා විසින් තථාගතයන් වහන්සේගේ සිරුරෙහි ලේ උපදවන්නේය යන කරුණ වන බවය. එය අවබෝධයට ගනී.

එමෙන්ම, යම් හෙයකින් සෝවාන් පුද්ගලයා එක්ව වාසය කරන සංඝයා භේද කරවන්නේය යන කරුණ නැතැයි දැනගනී. එනමුත් පෘථග්ජන පුද්ගලයා සංඝයා භේද කරන්නේය යන කරුණ ඇතැයි අවබෝධයෙන් දැනගනී.

එමෙන්ම, මේ කරුණ අස්ථානයි. වෙන්නට හැකියාව ඒ නැහැ. එනම්, යම් කරුණකින් සෝවාන් පුද්ගලයා අන් ශාස්තෘවරයෙක් මේ මාගේ ශාස්තෘවරයායි නොගන්නේය යන කරුණයි. එසේ ගන්නේ නැහැ. එනමුත් පෘථග්ජන පුද්ගලයා විසින් අන් ශාස්තෘවරයෙක් මේ මාගේ ශාස්තෘවරයායි ගන්නේය යන කරුණ විය හැකියි. මෙය අවබෝධ කරගනී.

තවත් කරුණක් ඇත. ඒ කුමක්ද? යම් හෙයකින් ලෝක ධාතුවෙහි අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේලා දෙදෙනෙක් පෙර පසු නොව එකටම උපදනාහුය යන කරුණ නොවන බවයි. එනමුත්, යම් හෙයකින් එක් ලෝක ධාතුවක එක් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ නමක් පමණක් උපදනාහ යන කරුණ ඇතැයි අවබෝධ කොට ගනී.

එමෙන්ම යම් හෙයකින්, එක් ලෝක ධාතුවෙක සක්විති රජවරු දෙදෙනෙක් පෙර පසු නොව එක්විටම උපදින්නේය යන කරුණ නොවන බවට දැනගනී. එනමුත්, එක් ලෝක ධාතුවක එක් සක්විති රජෙක් උපදනේය යන කරුණ ඇතැයි අවබෝධ කොටගනී.

නැවත මෙසේ සඳහන් කරයි. එනම්, යම් හෙයකින් ස්ත්‍රියක් සම්‍යක් සම්බුද්ධ වන්නීය යන කරුණ නොවන බවය. එනමුත්, පුරුෂයෙක්ම අර්හත් සම්‍යක් සම්බුද්ධ වන්නේය යන කරුණ ඇතැයි හෝ සත්‍ය බවට අවබෝධ කොට ගන්නා බවයි.

එමෙන්ම, යම් හෙයකින් ස්ත්‍රියක් සක්විති රජ වන්නීය යන කරුණ නැතැයි දැනගනී. එනමුත් පුරුෂයෙක් සක්විති රජ වන්නේය යන කරුණ ඇතැයි දැනගනී. අවබෝධයට ගනී.

එමෙන්ම යම්හෙයකින් ස්ත්‍රියක් ශක්‍ර භාවය පවත්වන්නීය යන කරුණ නැතැයි දැනගනී. එනමුත්, පුරුෂයෙක් ශක්‍ර භාවය කරන්නේය යන කරුණ ඇතැයි අවබෝධ කරගනී.

එමෙන්ම, යම් හෙයකින් ස්ත්‍රියක් මාරයා වන්නීය යන කරුණ නැතැයි දැනගනී. එනම් ස්ත්‍රියක් මාරයෝ බවට පත් නොවන්නීය. එනමුත්, පුරුෂයෙක්ම මාරයා වන්නේය යන කරුණ අවබෝධ කරගනී.

එමෙන්ම, යම්හෙයකින් ස්ත්‍රියක් බ්‍රහ්මත්වය කරන්නීය යන කරුණ සත්‍ය නොවන බව දැනගනී. එනමුත් පුරුෂයා බ්‍රහ්මත්වය කරන්නේය යන කරුණ ඇති බවට අවබෝධ කරගනී.

එමෙන්ම කාය, වාග්, මනඃ දුශ්චරිතයන්ගෙන් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාකයන් උපදනේය යන කරුණ නැතැයි දැනගනී. එනමුත් කාය, වාග්, මනෝ දුශ්චරිතවලින් අනිෂ්ඨ වූ නොහොඳ වූ අමනාප වූ විපාක උපදනේය යන කරුණ ඇතැයි දැනගනී. අවබෝධ කරගනී.

එමෙන්ම කාය, වාග්, මනෝ සුචරිතයන්ගෙන් අනිශ්ට වූ නොහොඳ වූ අමනාප වූ විපාක උපදනේය යන කරුණ නැතැයි දැනගනී. එනමුත් කාය, වාග්, මනෝ සුචරිතයන්ගෙන් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ විපාක උපදනේය යන කරුණ ඇතැයි දැනගනී. අවබෝධයට ගනී.

එමෙන්ම, යම් හෙයකින්, කාය, වාග්, මනෝ දුශ්චරිත නිසා සුගතියට පැමිණෙන්නේය යන කරුණ නොවන බව දැනගනී.



එනමුත් කාය, වාග්, මනෝ දුශ්චරිත නිසා අපාය වූ බොහෝ දුක්දෙන නිරයට පැමිණෙන්නේය යන කරුණ ඇතැයි දැනගනී. අවබෝධයට ගනී.

එමෙන්ම කාය, වාග්, මනෝ සුචරිතයන්ගෙන් සමන්වාගත පුද්ගලයා, එම හේතුවෙන් මරණින් මතු අපාය, බොහෝ දුක් දෙන නිරයෙහි උපදනේය යන කරුණ නොවන බව දැනගනී. එනමුත්, යම් හෙයකින්, කාය, වාග්, මනෝ සුචරිතයන්ගෙන් සමන්වාගත පුද්ගලයා, ඒ හේතුවෙන් මරණින් මතු සුගතියෙහි උපදිනේය යන කරුණ ඇතැයි දැනගනී. අවබෝධ කරගනී.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කරති. "ආනන්දය, මේ ආකාරයෙන් **ඨානාඨාන කුසල භික්ෂුව** යැයි කියන්නට සුදුසු වේ යයි" වදාළහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළ විට, ආනන්ද තෙරණුවන් මෙසේ කීය. "ආශ්චර්යයි, අද්භූතයි. (පුදුමයි). භාග්‍යවතුන් වහන්ස මේ කිනම් ධර්ම පර්යායක්ද?

"ආනන්ද, නුඹලා මෙය **බහුධාතුක** යැයි සිතෙහි තබා ගන්න. **චතු පරිවට්ට** යයි දරන්න. **ධර්මාදර්ශ** යයි දරන්න. **අමා බෙරය** යයි දරන්න. **අනුත්තර වූ සංග්‍රාම විජය** යයි සිතෙහි තබාගන්න. යනුවෙන් වදාළහ.

උතුම් චතුරාර්ය සත්‍යම අවබෝධ වේවා.

සාධු ! සාධු ! සාධු !

## පුණ්‍යානුමෝදනාව

තුන් ලොවක් නිවා සැනසූ මගේ භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය අප සැමට සරල බසින් දේශනා කරමින්, දහම් ඇස විවර කරන බත්තරමුල්ලේ සිරි සුදස්සනාරාම දහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක **අති පූජ්‍ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ** ඇතුළු ආරාම වාසී සියලුම ස්වාමීන් වහන්සේලොටද, ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

අහංගම, කතළුවේ, පදිංචිව සිටි **සොමී මාලිනී වික්‍රමසූරිය** නැන්දා පරලොව සැපත් වී වසරක් පිරීම සිහිකිරීම් වශයෙන් සහ ඉපදෙමින් මැරෙමින් යන මේ සංසාර ගමනින් අතිවිදීමටත් මෙම ධර්ම දානමය කුසලය උපකාර වේවා! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

එමෙන්ම අප දෙපාර්ශවයේම පරලොව සැපත්, දෙමව්පියන් වන **පවුලිස්. ඩබ්ලිව්. වීරසූරිය, ආර්. ජී. ජේන්ද සිල්වා, ඩබ්ලිව්. ඒ. පී. වීරරත්න, මැස්ලින් වික්‍රමසූරිය** මාගේ වැඩිමහල් සොයුරු උපාලි වීරරත්න යන මහත්ම මහත්මීන්ගේ සහ අප නමින් මියගිය සියලුම ඥාතී මිත්‍රාදීන්ටත් මේ පින් අනුමෝදන් වී උතුම් නිර්වාන ශාන්තිය අත්වේවා! යි ප්‍රාර්ථනා කරමු.

තවද, සුජීවත්ව සිටින දරු මුණුපුරු, මිණිපිරියන් ඇතුළු සියලු ඥාතිමිත්‍රාදීන්ටත් "ප්‍රඥා ප්‍රභා" සංවිධානයේ සැමටත්, මුද්‍රණ කටයුතු කරදුන් කාර්ය මණ්ඩලයේ සැමටත් මේ උතුම් ධර්ම දානමය කුසලය බැති සිතින් අනුමෝදන් කරමු. සියලු දෙනාටම ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් නිර්වාන ශාන්තිය ලැබේවා !

සුමිත්‍රා වීරරත්න (වීරසූරිය) සහ පවුලේ සැම
තලවතුගොඩ.
2016-08-17



## පුණ්‍යානුමෝදනාව

බත්තරමුල්ල, සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක **ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන්
වහන්සේ** ඇතුළු ආරාමවාසී සියළුම ස්වාමීන් වහන්සේලාට
නිදුක්, නිරෝගී සුවය හා උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ වේවායි පළමුව පතමි.

පරලෝ සැපත් **ජී.එල්. හෙට්ටිආරච්චි පියතුමාට,
තේජසිරි ධර්මවංශ මාමාට** සහ අනෙකුත් සියළුම ඥාති
හිතමිත්‍රාදීන්ට දානයන් අතර උතුම්ම දානය වන මෙම ධර්ම
දානමය කුසලය අත්වේවා. ඔවුන්ට චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ වී නිවන් සුව ලබත්වායි පතන්නේ,

පාදුක්ක, කුරගල, ශෛලන්තාරාම විහාරස්ථානයෙහි
2016 වර්ෂයෙහි කඨින පිංකමෙහි ප්‍රධාන දායකත්වය දරණ
ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නගරයේ පදිංචි
**කුමුදුමාල් හෙට්ටආරච්චි** විසිනි.

2016-08-17